# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2022.12.15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 නොවැම්බර්

**2022 නොවැම්බර් මාසයේදී, නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුබෑමක් පෙන්නුම් කරන ලදී.**

**පසුගිය මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පසු බෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 නොවැම්බර් මාසයේ දී 42.1ක අගයක් වාර්තා ලදී.** මෙම පසුබෑම සඳහා ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය හැර අනෙකුත් සියලුම උප-දර්ශකයන්ගේ පහත වැටීම හේතු විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන නොවැම්බර් මාසයේ දී ද පහත වැටුනු අතර, මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් ආහාර හා පාන නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම පහල යාම හේතු විය. පාරිභෝගිකයන්ගේ මිල දී ගැනීමේ හැකියාව පහත වැටීම මෙලෙස ඉල්ලුම අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වූ බව ආහාර හා පාන නිෂ්පාදන අංශය නියෝජනය කරන බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. මේ අතර, ඇඟළුම් නිෂ්පාදකයින් ඇතුළු අපනයනාභිමුඛ කර්මාන්තවල යෙදී සිටින නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි, ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි පවතින ආර්ථික මන්දගාමීත්වය මෙන්ම දැඩි තරඟකාරීත්වය මධ්‍යයේ වෙනත් රටවලට ඇණවුම් ගලා යාම අපනයන ඉල්ලුම පහළ යෑම සඳහා හේතු විය. මෙයට අමතරව, විදේශ විනිමය හිඟය හේතුවෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම ඇතැම් නිෂ්පාදකයින්ට ගැටළුවක්ව පැවතුනි. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිල දී ගැනුම් ද පහත වැටුණි. මේ අතර, පසුගිය මාසයට සාපේක්ෂව 2022 නොවැම්බර් මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි විය.


| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **38.4** | **42.1** | **+** | අඩු වේගයකින් පහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 33.0 | 38.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 32.5 | 35.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.0 | 48.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 35.9 | 43.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 49.0 | 52.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික කටයුතු වර්ධනය වීමක් අපේක්ෂා කරමින් 2022 නොවැම්බර් මාසයේ දී ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ යන ලදී.

| | |
|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය** **42.1** | **2022 ඔක්තෝම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.7 ක ඉහළ යෑමකි** |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6කින් පහළ යමින් 2022 නොවැම්බර් මාසයේ දී 48.8ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පසුගිය මාසයට සාපේක්ෂව 2022 නොවැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉන්දියාව සහ රුසියාවේ වැඩි වේගයකින් ද සිංගප්පූරුවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 2022 නොවැම්බර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 දෙසැම්බර් 14 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 ඔක්තෝබර් මාසයේ පැවති 47.9 සිට නොවැම්බර් මාසයේ දී දර්ශකාංක 49.0ක් දක්වා ඉහළ ගියද, කඩඉම් මට්ටමට වඩා තරමක් පහළින් පැවතුනි.** සේවා අංශයෙහි ක්‍රියාකාරකම්වල පහත වැටීමේ වේගය අඩු වීම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ වර්ධනය හේතු විය. කෙසේ වෙතත්, සේවා නියුක්තියෙහි සහ නිමකිරීමට නියමිත කාර්යයන්හි පහළ යෑමක් වාර්තා විය.

ප්‍රධාන වශයෙන්, සමහර මූල්‍ය සේවා, රක්ෂණ සහ අනෙකුත් පෞද්ගලික සේවාවල දක්නට ලැබුණු ඉහළ යෑමත් සමඟ, 2022 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2022 නොවැම්බර් මාසයේ දී නව ව්‍යාපාර වර්ධනය විය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ යෑමේ ප්‍රවණතාව එළඹෙන උත්සව සමය හේතුවෙන් 2022 නොවැම්බර් මාසයේ දීත් පැවතුනි. ඒ අනුව, අනෙකුත් පෞද්ගලික සේවා, මූල්‍ය සේවා සහ විදුලි සංදේශ යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් පෙර මාසයට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළේය. තවද, සංචාරක පැමිණීම්වල වැඩිවීමට සමගාමීව, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද ඉහළ ගියේය. කෙසේ වෙතත්, ජීවන වියදම් අභියෝග මධ්‍යයේ තොග හා සිල්ලර වෙළඳාම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් මාසය තුළ තවදුරටත් පහත වැටුණි.

සමාගම් කිහිපයක නව බඳවා ගැනීම් සිදු වුවද, සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් ඉහළ යෑම හේතුවෙන් නොවැම්බර් මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, නව ව්‍යාපාරවල අඩුවීම මධ්‍යයේ නිමකිරීමට නියමිත කාර්යයන් වැඩි වේගයකින් පහළ ගියේය.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **47.9** | **49.0** | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ව්‍යාපාර | 49.0 | 53.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 54.2 | 53.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 33.9 | 37.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.6 | 41.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.9 | 59.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්, විශේෂයෙන් උත්සව සමය සහ ආර්ථික තත්ත්වයේ වැඩිදියුණුවීම පිළිබඳ සුබවාදී බලාපොරොත්තු හේතුවෙන්, 2022 නොවැම්බර් මාසයේ දී තවදුරටත් වර්ධනය විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**49.0**

**2022 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.1ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි පහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 ඔක්තෝබර් මාසයේ පැවති 49.2 සිට 2022 නොවැම්බර් මාසයේ දී 48.1ක් දක්වා පහළ ගියේය.

ඉන්දියාව සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2022 නොවැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, චීනය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 දෙසැම්බර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.